# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 2017 සැප්තැම්බර් මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2017 සැප්තැම්බර් මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **15.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **20.00 යි.**

## 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 සැප්තැම්බර් මස 22 වන දින]

එල්. ඩී. — ඕ. 30/2015.

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''එක් සතියක්'' යන වචන යොදා ඇති සෑම ස්ථානයකට එම වචන වෙනුවට ''සති හතරක්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1988 අංක 2 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ සඳහන් ''ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට තුනක් එකතු කරන ලද විට ලැබෙන සංඛ්‍යාවට සමාන අපේක්ෂක සංඛ්‍යාවක්, ඔවුන්ගේ නම්වල ප්‍රමුඛත්වය අනුව දැක්වෙන, එක් නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය. ඒ නාමයෝජනා පත්‍රය මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය" යන වචන වෙනුවට "මැතිවරණ කොට්ඨාස සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ නම් දැක්වෙන සහ දිස්ත්‍රික් ලැයිස්තුවේ සහ මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ ඇතුළත් අපේක්ෂකයන්ගේ නම් දැක්වෙන නාමයෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම නාමයෝජනා පත්‍ර නීති මගින් නියම කර ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය:

එසේ වුව ද, එවැනි ලැයිස්තු ඉදිරිපත් කිරීමේ දී, මැතිවරණ කොට්ඨාසය සඳහා වන ලැයිස්තුවෙන් නාම

යෝජනා කළ යුතු අපේක්ෂකයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් හයෙන් එකකට අඩු නොවන ගණනක් සහ දිස්ත්‍රික් ලැයිස්තුවේ සම්පූර්ණ අපේක්ෂකයන් ගණනින් සියයට පනහකට අඩු නොවන අපේක්ෂකයන් සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන් විය යුතු බවට එක් එක් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් වග බලා ගත යුතු ය:

එසේම තවදුරටත්, අවස්ථාවෝචිත පරිදි, හයෙන් එක හෝ සියයට පනහ අනුරූප වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම පූර්ණ සංඛ්‍යාව අදාළ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාමයෝජනා කැඳවීමට සමගාමීව, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නිවේදනයක් මගින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා එක් එක් ලැයිස්තුවක නාමයෝජනා කළ යුතු කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව සඳහන් කළ යුතු ය.'';

(2) එහි (3) වන උපවගන්තියේ "නාමයෝජනා පත්‍රයේ මුලින්ම නම සඳහන්ව ඇති" යන වචන වෙනුවට "කණ්ඩායම් නායකයා" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (4) වන උපවගන්තියේ "ඒ නාම යෝජනා පත්‍රයේ මුලින්ම" යන වචන වෙනුවට "දිස්ත්‍රික් ලැයිස්තුවේ අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් නාමයෝජනා පත්‍රයේ මුලින්ම"යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (5) වන උපවගන්තියේ "ඒ නාමයෝජනා පත්‍රයෙහි" යන වචන වෙනුවට "දිස්ත්‍රික් ලැයිස්තුවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (7) වන උපවගන්තියේ "මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූලව" යන වචන වෙනුවට "නීති මගින් නියම කර ඇති ආකෘතියට සාරානුකූලව" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය, එම ප්‍රඥප්තියේ 3අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට 3අ වගන්තිය ඇතුළත් කිරීම.

"සීමා නිර්ණය කිරීමේ කමිටුව.

3අ. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් සති දෙකක් ඇතුළත, ජනාධිපතිවරයා විසින්, ශ්‍රී ලාංකික ජන සමාජයේ බහුවිධ ස්වභාවය, වෘත්තීයමය හා සමාජමය විවිධත්වය ද, ඇතුළත් වන පරිදි නියෝජනය වන ආකාරයට *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් පත් කරනු ලබන පස්දෙනකුගෙන් සමන්විත (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමා නිර්ණය කිරීමේ කමිටුවක් තිබිය යුතු අතර, ඔවුන් අතරින් එක් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් කමිටුවේ සභාපති ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(2) 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර, අදාළ පරිපාලන දිස්ත්‍රික්කයෙන් තේරී පත්වන මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් සියයට පනහකට (50%) අනුරූප වන පරිදි කමිටුව විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය, යම් මැතිවරණ කොට්ඨාස ගණනකට බෙදිය යුතු ය:

එසේ වුව ද, 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර, යම් පරිපාලන දිස්ත්‍රික්කයකින් තේරී පත්වන මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් සියයට පනහකට (50%) අනුරූප වන මන්ත්‍රීවරයන් ගණන, පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවකින් සමන්විත වන අවස්ථාවක දී, එම සංඛ්‍යාව ආසන්නතම පූර්ණ සංඛ්‍යාව ලෙස ගනු ලැබිය යුතු ය.

(3) කමිටුව විසින් ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයට නම් වෙන් කර දෙනු ලැබිය යුතු ය.

(4) පරිපාලන දිස්ත්‍රික්ක එසේ මැතිවරණ කොට්ඨාසවලට බෙදීමේ දී, කමිටුව විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:—

(අ) වාර්ගික, ආගමික හෝ අන්‍යාකාරයෙන් යම් සම්බන්ධතාවක් සහිත ප්‍රජාවක් මගින් එකමුතු වූ, එහෙත් එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ බහුතරයෙන් මෙම සම්බන්ධතා එකක් හෝ වැඩි ගණනකින් වෙනස් වන්නා වූ පරිදි යම් වැදගත් එකමුතුවක් යම් පරිපාලන දිස්ත්‍රික්කයක, යම් ප්‍රදේශයක සිටින බවට කමිටුවට පෙනී යන අවස්ථාවක දී, කමිටුව විසින්, යම් මැතිවරණ කොට්ඨාස ප්‍රමාණයකට එම පරිපාලන දිස්ත්‍රික්ක බෙදනු ලැබිය හැකි ය;

(ආ) එම බෙදීම සිදු කිරීමේ දී, කමිටුව විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය; එනම්-

(i) පළාතේ පරිපාලන දිස්ත්‍රික්කවල පවතින ඇතැම් මැතිවරණ කොට්ඨාස තුළ පදිංචිව සිටින තැනැත්තන් සංඛ්‍යාව සමානුපාතික නොවන අවමයක් දක්වා අඩු කිරීම පිළිබඳ කැමැත්ත; සහ

(ii) මැතිවරණ කොට්ඨාසවල භූගෝලීය සහ භෞතික ගති ලක්ෂණ.

(5) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයන් වලට සැලකිල්ලක් දක්වමින්, යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා, එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි ගණනක් තෝරා යැවිය යුතු මැතිවරණ කොට්ඨාසයක් නිර්මාණය කිරීම උචිත බව කමිටුවේ අදහස වන අවස්ථාවක දී, කමිටුව විසින් බහු මන්ත්‍රී මැතිවරණ කොට්ඨාසයක් හෝ කොට්ඨාස නිර්මාණය කරනු ලැබිය යුතු ය.

(6) පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ වූ එක් එක් මැතිවරණ කොට්ඨාසයකට, පළාත් සභාවට එක්

මන්ත්‍රීවරයකු හෝ මන්ත්‍රීවරුන් වැඩි ගණනක් සෘජුවම තෝරා යැවීමට හිමිකම තිබිය යුතු ය.

(7) කමිටුව විසින්, පත් කරන ලද දිනයේ සිට මාස හතරක් (4) ඇතුළත මෙම වගන්තියේ (2), (3), (4) සහ (5) උපවගන්තිවල නියමයන් ප්‍රකාරව ස්වකීය වගකීම් හා යුතුකම් ඉටු කරනු ලැබිය යුතු අතර, ඉන් පසුව අමාත්‍යවරයා වෙත එහි වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(8) කමිටුව විසින් එය වෙත පැවරී ඇති කාරණා පිළිබඳව තීරණය කිරීමේ දී එකඟත්වයකට එළඹීම සඳහා වෑයම් කරනු ලැබිය යුතු ය.

(9) කමිටුව විසින් එහි වගකීම් ඉටු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව තීරණය කළ යුතු ය.

(10) මෙම වගන්තියේ නියමයන් ප්‍රකාරව කමිටුව විසින් එහි වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි යම් නිලධරයන්, විශේෂඥයන්, තාක්ෂණික කමිටු සහ උපකමිටු පත් කරනු ලැබිය යුතු ය.

(11) කමිටුව විසින් එහි වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වාර්තාව තමා වෙත ලැබීමෙන් පසු සති දෙකක කාලයක් ඇතුළත (පැමිණ නොසිටින මන්ත්‍රීවරුන් ද ඇතුළුව) ඒ සඳහා පක්ෂව ඡන්දය දෙනු ලබන මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් අනුමත කරනු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

(12) වාර්තාව සභාගත කිරීමෙන් පසු එක් මාසයක කාලයක් ඇතුළත (11) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව එම වාර්තාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලබන විට, කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ප්‍රධාන ජනවර්ගයන් නියෝජනය කරනු ලබන තැනැත්තන් පස්දෙනකුගෙන් සමන්විත සමාලෝචන කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය.

(13) යම් මැතිවරණ කොට්ඨාසයක නම්, අංක සහ මායිම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුව විසින් යම් වෙනස් කිරීම් කරනු ලැබිය යුතු ය.

(14) අමාත්‍යවරයා විසින් සමාලෝචන කමිටුවේ සැලකිල්ලට වාර්තාව යොමු කරනු ලැබීමෙන් මාස දෙකක් (02) ඇතුළත, සමාලෝචන කමිටුව විසින් (13) වන උපවගන්තිය යටතේ එහි වගකීම් සහ කාර්ය සම්පූර්ණ කළ යුතු අතර ඉන් අනතුරුව එහි වාර්තාව ජනාධිපතිවරයාට භාර දිය යුතු ය.

(15) සමාලෝචන කමිටුවේ වාර්තාව ලැබුණු විට, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින්, වහාම මැතිවරණ කොට්ඨාසවල නව අංක, මායිම් සමාලෝචන කමිටුවේ වාර්තාව මත පිහිටා නිර්මාණය කරන ලද මැතිවරණ කොට්ඨාසවලට වෙන් කර දී ඇති නම් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(16) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා යවනු ලැබීමට හිමිකම ඇති මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව -

(අ) ඒ පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින්; සහ

(ආ) 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද පළාතේ එම පරිපාලන දිස්ත්‍රික්කයෙන් තේරී පත් වන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට එම දිස්ත්‍රික්කයෙන් තේරී පත් වී ඇති මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සමාන වන බවට වගබලා ගැනීම සඳහා තෝරාපත් කරනු ලැබිය යුතු (මෙහි මින්මතු "අමතර මන්ත්‍රීවරුන්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් අමතර මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(17) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පළාත් සභාවට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ අරමුණින් තරඟ කරන යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ (මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන අපේක්ෂකයන් කණ්ඩායමක් විසින් -

(අ) (මේ පනතේ මින්මතු "මැතිවරණ කොට්ඨාස ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා නම් කරන ලද එක් එක් අපේක්ෂකයන්ගේ නම් දක්වමින්; සහ

(ආ) (මේ පනතේ මින්මතු "දිස්ත්‍රික් ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) එම පරිපාලන දිස්ත්‍රික්කයෙන් තේරී පත්වීමට හිමිකම් ලබන අමතර මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා තුන්දෙනකු වැඩි වන සේ, එම පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් අමතර අපේක්ෂකයන්ගේ නම් දක්වමින්,

නාමයෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

''තරගයක් නොමැති ඡන්ද විමසීම්.

18. (1) එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ එක් ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයන් පමණක් තෝරාපත්කර ගැනීම සඳහා නාමයෝජනා කර ඇති අවස්ථාවක දී, එම පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ සඳහන් අපේක්ෂකයන් එම පළාත් සභාව සඳහා තෝරා පත්කර ගෙන ඇති බවට තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, දිස්ත්‍රික් ලැයිස්තුවේ සඳහන් නම් වලින් කුමන අපේක්ෂකයන් එම පළාත් සභාව සඳහා අමතර

මන්ත්‍රීවරුන් වශයෙන් තේරී පත්වී ඇති බවට ප්‍රකාශ කළ යුතු ද යන්න පිළිබඳව තේරීම්භාර නිලධරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් කාලසීමාවක් ඇතුළත තීරණය කරන ලෙසට තේරීම්භාර නිලධරයා විසින් එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට දන්වා සිටිනු ලැබිය යුතු ය. තේරීම්භාර නිළධරයා විසින් නිශ්චිතව දක්වන ලද කාලසීමාවක් ඇතුළත එම පක්ෂ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් ස්වකීය තීරණය තේරීම්භාර නිලධරයා වෙත සන්නිවේදනය කරනු ලබන අවස්ථාවක දී, එම පළාත් සභාවේ තේරී පත් වූ අමතර මන්ත්‍රීවරුන් වශයෙන් තේරීම්භාර නිලධරයා විසින් එම අපේක්ෂකයන් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය. තේරීම්භාර නිලධරයා විසින් නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඇතුළත එම ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් ස්වකීය තීරණය තේරීම්භාර නිලධරයා වෙත සන්නිවේදනය කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, එම පළාත් සභාව සඳහා තෝරා පත් කිරීමට නියමිත අමතර මන්ත්‍රීවරුන් සංඛ්‍යාවට සමාන වන්නා වූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් එම දිස්ත්‍රික් ලැයිස්තුවේ ස්වකීය නම් සඳහන් අනුපිළිවෙල අනුව තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරුන් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය. 58ආ වගන්තියේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි, එම ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් කරනු ලබන නාමයෝජනා කිරීමකට හෝ තේරීම්භාර නිලධරයා විසින් මේ උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමකට අදාළ විය යුතු ය.

(2) තේරීම්භාර නිලධරයා විසින් කොමසාරිස්වරයා වෙත, නියම කරන ලද ආකෘතියට සාරානුකූලව වහාම වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, කොමසාරිස්වරයා විසින් එසේ තෝරා පත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා තරග කරනු ලබන එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම් සහ එම එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමට වෙන්කර දී ඇති අනුමත ලකුණ සහ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ හඳුනාගැනීමේ අංකයක් වෙතොත්, එම අංකය; සහ -

(i) එක් එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තරග කරනු ලබන එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම්; සහ

(ii) එක් එක් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයේ සඳහන් වන අනුපිළිවෙලට අනුව දිස්ත්‍රික් ලැයිස්තුව මත වූ එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම්;";

(ආ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට "මැතිවරණ කොට්ඨාස" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ "ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට " මැතිවරණ කොට්ඨාස" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(4) තේරීම්භාර නිලධරයා විසින් යම් මැතිවරණ කොට්ඨාසයක පවතින විශේෂිත අවස්ථාගත කරුණු

සැලකිල්ලට ගෙන, එම මැතිවරණ කොට්ඨාසයෙන් පිටත යම් ඡන්ද මධ්‍යස්ථානයක් තීරණය කරනු ලබන අවස්ථාවක දී හැර, එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද මධ්‍යස්ථානය හෝ ඡන්ද මධ්‍යස්ථාන එම මැතිවරණ කොට්ඨාසය ඇතුළත පිහිටා තිබිය යුතු ය. ඡන්ද මධ්‍යස්ථානයේ පිහිටීම, එම මැතිවරණ කොට්ඨාසයේ ඡන්දහිමියන් සඳහා අවම අපහසුතාවක් ඇති වන පරිදි විය යුතු ය:

එසේ වුව ද, එක් මැතිවරණ කොට්ඨාසයකට වැඩි මැතිවරණ කොට්ඨාස ගණනක් සම්බන්ධයෙන් යම් ඡන්ද මධ්‍යස්ථානයක් පිහිටුවන ලැබිය යුතු බවට විධාන කිරීම සඳහා සියලු අවස්ථාවල දී මැතිවරණ කොමිෂන් සභාවට බලතල ඇත්තේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියේ “මේ පනතේ දෙවන උපලේඛනයේ ඇතුලත් නියෝග” යන වචන සඳහන් වන සෑම ස්ථානයක් සඳහාම “නීති මගින් නියම කරනු ලබන පරිදි” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ “මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ” යන වචන වෙනුවට “නීති මගින් නියම කරනු ලබන ආකෘතියට සාරානුකූල වූ” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

“(ආ) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තරඟ කරනු ලබන එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම් සහ, එම එක් එක් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සඳහා වෙන්කර දී ඇති අනුමත ලකුණ සහ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට “ස්වාධීන කණ්ඩායම” යන වචන සහ හඳුනාගැනීමේ අංකයක් වෙතොත්, එම අංකය, සහ-

(i) එක් එක් මැතිවරණ කොට්ඨාස සම්බන්ධයෙන් තරඟ කරනු ලබන එක් එක් පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම්; සහ

(ii) එක් එක් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයේ සඳහන් වන අනුපිළිවෙලට අනුව දිස්ත්‍රික් ලැයිස්තුව මත වූ එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම්.''.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූලව" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතියට සාරානුකූලව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) එම පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තරඟ කරනු ලබන එක් එක් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සඳහා වෙන්කර දී ඇති අනුමත ලකුණ සහ එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාසය සඳහා තරඟ කරනු ලබන එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම් අන්තර්ගත විය යුතු ය".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූලව" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතියට සාරානුකූලව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනතේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට" යන වචන වෙනුවට "ඡන්දදායකයන්ට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනතේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට" යන වචන වෙනුවට "ඡන්දදායකයන්ට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) එහි (අ) ඡේදයේ "ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට" යන වචන වෙනුවට "ඡන්දදායකයන්ට" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදයේ "මේ පනතේ හතරවන උපලේඛනයේ සඳහන් ආකෘතියට" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතියට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් "ඉ", "ඊ" සහ "උ" ආකෘතිවල" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතිවල" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය එහි, "මේ පනතේ පළමුවන උපලේඛනයෙහි ""ඌ" ආකෘතියට" යන වචන සහ "මේ පනතේ පළමුවන උපලේඛනයේ "එ" ආකෘතියට" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතියට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඒ" ආකෘතියට" යන වචන වෙනුවට "නීති මගින් නියම කරන ලද ආකෘතියට" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (5) වන උපවගන්තියේ "නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධව ද, ඒ ඡන්ද පොළෙහි දෙන ලද ඡන්ද හැර) ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාව" යන වචන වෙනුවට "සමස්ථයක් වශයෙන් එක් එක් මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් සහ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධව ද, ඒ ඡන්ද පොළෙහි දෙන ලද ඡන්ද හැර දෙන ලද ඡන්ද සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (6) වන සහ (7) වන උපවගන්තිවල "පරිපාලන දිස්ත්‍රික්කය" යන වචන වෙනුවට "පරිපාලන දිස්ත්‍රික්කය හෝ මැතිවරණ කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (8) වන උපවගන්තියේ -

(අ) "ඡන්ද සංඛ්‍යාව ද ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලදුව, (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ ගෙන හැර දැක්වෙන මනාප ඡන්ද සංඛ්‍යාව ද" යන වචන වෙනුවට "සමස්ථයක් වශයෙන් එක් එක් මැතිවරණ කොට්ඨාසය සහ පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් වන ඡන්ද සංඛ්‍යාව ද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "ඡන්ද සංඛ්‍යාවට සහ ඒ එක් එක් අපේක්ෂකයා ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාවට," යන වචන වෙනුවට "ඡන්ද සංඛ්‍යාවට" යන වචන ආදේශ කිරීමෙන්.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, "ඡන්ද පෙට්ටිවල" යන වචන වෙනුවට "එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්ද පෙට්ටිවල" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5) වන උපවගන්තියේ "ද්විත්ව ඡන්ද පත්‍රිකා" යන වචන වෙනුවට "එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ ද්විත්ව ඡන්ද පත්‍රිකා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "මග පෙන්වීම සඳහා මේ පනතේ තුන්වන උපලේඛනයේ දී ඇති උපදෙස්වලට" යන වචන වෙනුවට "මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වලට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (7) වන උපවගන්තියේ "සෑම අපේක්ෂකයකු වෙනුවෙන්ම සඳහන් කොට ඇති මනාප ඡන්ද සංඛ්‍යාව" යන වචන වෙනුවට "අපේක්ෂකයා වෙනුවෙන් එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළව ලබා දී ඇති ඡන්ද සංඛ්‍යාව සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (8) වන, (9) වන සහ (10) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (ඌ) ඡේදයේ ඒ එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද මනාප ඡන්ද සංඛ්‍යාව" යන වචන වෙනුවට "එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළව ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ "මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති" සහ "තේරීම්භාර නිලධරයා" යන වචන වෙනුවට පිළිවෙළින් "නීති මඟින් නියම කරනු ලබන" සහ "එක් එක් මැතිවරණ කොට්ඨාස සම්බන්ධයෙන් වෙන වෙනම ඡන්ද ගණන් කිරීම තහවුරු කිරීම සඳහා තේරීම් භාර නිලධරයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සඳහන් කොට ඇති මනාප ඡන්ද සංඛ්‍යාව ද" යන වචන වෙනුවට

"අපේක්ෂකයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ), (ඇ), (ඉ) සහ (ඊ) වන උපවගන්ති වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(ආ) එක් එක් මැතිවරණ කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් සහ එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් එහි නාමයෝජනා පත්‍රයේ එම මැතිවරණ කොට්ඨාසය සඳහා එහි අපේක්ෂකයා වශයෙන් නම් කරන ලද අපේක්ෂකයා එම මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කරන ලද මන්ත්‍රීවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය;

(ඇ) යම් පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර හෝ ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර හෝ ඡන්ද සමාන වී ඇති අවස්ථාවක දී සහ එක් ඡන්දයක් එකතු කිරීම මගින් එවැනි එක් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නම් කරනු ලබන අපේක්ෂකයා එම මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබීම සඳහා හිමිකම් ලබන අවස්ථාවක දී, එම අමතර ඡන්දය දෙන ලද බවට සලකනු ලැබිය යුතු දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම තීරණය කිරීම ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා ඉදිරියේ ඔහු විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් සිදු කරනු ලබන කුසපත් ඇදීමකින් සිදු කළ යුතු ය.";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58අ සහ 58ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 58අ සහ 58ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු යː-

"පළාත් සභා මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම.

58අ. (1) 58 වන වගන්තිය යටතේ වන ප්‍රකාශය සිදුකිරීමෙන් පසු, පරිපාලන දිස්ත්‍රික්කයේ සියලුම මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත් කරන ලද අමතර මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මෙම වගන්තියේ මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට බෙදා වෙන් කළ යුතු ය.

(2) පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ සියලු අපේක්ෂකයන් විසින් ලබාගත් වලංගු මුළු ඡන්ද සංඛ්‍යාව එම පරිපාලන දිස්ත්‍රික්කයෙන් පළාත් සභාව සඳහා තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් බෙදිය යුතු ය. එම බෙදීමෙන් ලැබෙන සංඛ්‍යාව (යම් භාග සංඛ්‍යාවක් සැලකිල්ලට නොගෙන) මේ වගන්තියේ මෙහි මින්මතු "තීරක අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) අදාළ මැතිවරණ කොට්ඨාස තුළ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් විසින් ලබාගත් ඡන්දවල එකතුව ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවේ මන්ත්‍රීවරුන් ලෙස එම එක් එක් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු තැනැත්තන් සංඛ්‍යාව තහවුරුකර ගැනීම පිණිස තීරක අංකයෙන් බෙදිය යුතු ය. මේ ක්‍රමය මගින් තහවුරු කරගන්නා ලද සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් හා භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී පූර්ණ සංඛ්‍යාව මෙම උපවගන්තියේ කාර්ය සඳහා සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නියමයන්ට අනුව, අවස්ථාවෝචිත පරිදි, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් ඒ පළාත් සභාවේ මන්ත්‍රීවරයන් ලෙස ඒ පරිපාලන

දිස්ත්‍රික්කයෙන් තෝරා පත්කර ගැනීමට සහ තෝරා යැවීමට හිමිකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාව තහවුරු කර ගැනීමෙන් පසුව ඒ පළාත් සභාව සඳහා ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ඒ පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයන් සංඛ්‍යාව -

(අ) (3) වන උපවගන්තිය යටතේ මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු යැයි තහවුරු කරගන්නා ලද සංඛ්‍යාව ඉක්මවනු ලබන විට එම වැඩි සංඛ්‍යාව ඡන්ද කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු යයි තහවුරු කර ගන්නා ලද සංඛ්‍යාවට වඩා අඩු වන අවස්ථාවක දී එම අමතර මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත් කරනු ලැබ ඇති හෝ මන්ත්‍රීවරුන් වීමට නුසුදුස්සන් වන අපේක්ෂකයන් හැර මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ හෝ දිස්ත්‍රික් ලැයිස්තුවේ අපේක්ෂකයන්ගෙන් පිළිගත් දේශපාලන පක්ෂයේ අදාළ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් තෝරා යැවිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ක්‍රමය මත පදනම් වී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තෝරා යවනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තහවුරු කිරීම අවසන් කිරීමේ දී, (4) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා යැවීමට තවදුරටත් මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් ඉතිරිව ඇති විට, ඒ ඉතිරි මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, (3) වන උපවගන්තිය යටතේ තහවුරු කරන ලද පරිදි එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ලබාගත් ඉහළම භාග

සංඛ්‍යාව මත පදනම් වී වෙන් කර දෙනු ලැබිය යුතු ය.

(6) තේරීම් භාර නිලධරයා විසින්, මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කාන්තා මන්ත්‍රීවරයන් ද ඇතුළුව, මන්ත්‍රීවරයන් යම් සංඛ්‍යාවක් තෝරා යවනු ලැබීමට හිමිකම ලැබූ, අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට, මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ හෝ දිස්ත්‍රික්ක ලැයිස්තුවේ අපේක්ෂකයන්ගෙන් තේරී පත් වී ඇති අපේක්ෂකයින් හෝ මන්ත්‍රීවරයන් වීමට සුදුසුකම් නොලබන අපේක්ෂකයන් හැර, කාන්තා මන්ත්‍රීවරයන් ද ඇතුළුව යම් මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තේරී පත් වීමට සහ තෝරා යවනු ලැබීමට හිමිකම් ලබන බව අවස්ථාවෝචිත පරිදි, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට දැන්විය යුතු ය. ඒ අනුව, අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා ඒ උපවගන්තිය යටතේ තෝරා යවනු ලැබිය යුතු, තැනැත්තන් නම් කරනු ලැබිය යුතු ය.

(7) ඉන් අනතුරුව, මේ වගන්තිය යටතේ, තෝරා යවනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ නම්, අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(8) පළාතක් තුළ පිහිටි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු සහ තෝරා යවනු ලැබිය යුතු, මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් සියයට විසිපහක ප්‍රමාණයක් කාන්තා මන්ත්‍රීවරයන් විය යුතු බවට කොමසාරිස්වරයා විසින් වගබලා ගත යුතු ය:

එසේ වුව ද, මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් සියයට විසි පහ සංයුක්ත වන සංඛ්‍යාව, පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවකින් සමන්විත වන අවස්ථාවක දී, පූර්ණ සංඛ්‍යාව මේ වගන්තියේ කාර්යය සඳහා සියයට විසිපහ සංයුක්ත වන සංඛ්‍යාව විය යුතු ය:

එසේම තවදුරටත්, මේ පනත ප්‍රකාර සංස්ථාපනය කරන ලද පළාත් සභාවක්, මේ උපවගන්තියේ විධිවිධාන සමග අනුකූල වීමට නොහැකි වීම නිසා පමණක් ම, නීත්‍යානුකූල නොවන බවට සලකනු නොලැබිය යුතු ය.

තෝරා යවනු ලැබිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව.

58ආ. (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා තේරී පත්වන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තෝරා පත් කරනු ලැබිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් වීමට හේතුවන්නා වූ ද, ඒ මගින් 58අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තහවුරු කරන ලද, තෝරා පත් කරනු ලැබිය යුතු සහ තෝරා යැවිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ඉක්මවනු ලබන්නා වූ ද, අවස්ථාවක දී, මේ වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන, ඒ පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අදාළ නොවිය යුතු ය.

(2) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින්, පරිපාලන දිස්ත්‍රික්කයක දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට විස්සකට අඩුවෙන් ලබාගෙන ඇති අවස්ථාවක දී, මේ වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන ඒ පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අදාළ නොවිය යුතු ය.

(3) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයෙන් එක් පළාත් සභාවකට තෝරා පත් කළ යුතු සහ තෝරා යවනු ලැබිය යුතු, කාන්තා මන්ත්‍රීවරයන් සංඛ්‍යාව මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් කර ඇති පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නොවන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වලට බෙදා වෙන් කර දීම, ඒ පරිපාලන දිස්ත්‍රික්කය තුළ වෙනත් පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල වලංගු ඡන්ද සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ දක්වා ඇති බෙදා වෙන් කර දීමේ ක්‍රමය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට අදාළ විය යුතු ය.

(4) පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ ඇති සියලුම මැතිවරණ කොට්ඨාසවලට යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තෝරා පත් කර ගනු ලැබිය යුතු කාන්තා මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, මේ වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව බෙදා වෙන් කර දෙන ලද මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා අඩු වන අවස්ථාවක දී, එම අඩු වන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තේරී පත් වී සිටින හෝ මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සකු වී සිටින අපේක්ෂිකාවන් නොවන, මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ හෝ දිස්ත්‍රික් ලැයිස්තුවේ සිටින කාන්තා අපේක්ෂිකාවන් අතුරින් තෝරා යවනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය, ඒ වගන්තියේ "මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඔ" ආකෘතියට" යන වචන වෙනුවට "නීති මගින් නියමිත ආකෘතියට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) "එම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වීම සඳහා මේ පනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු" යන වචන වෙනුවට, "තේරී පත් වී සිටින හෝ මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සකු වී සිටින අපේක්ෂකයන් නොවන, මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ හෝ දිස්ත්‍රික් ලැයිස්තුවේ වෙනත් යම් අපේක්ෂකයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) "එම පක්ෂය හෝ කණ්ඩායම විසින් ඒ පුරප්පාඩුව ඇති වූ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා භාර දෙන ලද නාම යෝජනා පත්‍රයෙන් එම පක්ෂයෙන් හෝ

කණ්ඩායමෙන් එම පළාත් සභාවට තේරී පත් වූ බව ප්‍රකාශයට පත් කරන ලද අවසාන මන්ත්‍රීවරයා ළඟට එම පළාත් සභාවට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ දී මනාප වැඩි ගණනක් ලබා ගත් අපේක්ෂකයා" යන වචන වෙනුවට, "තේරී පත් වී සිටින හෝ මන්ත්‍රීවරයෙක් වීමට නුසුදුස්සකු වී සිටින අපේක්ෂකයකු නොවන, දිස්ත්‍රික් ලැයිස්තුවේ ඊළඟට සිටින අපේක්ෂකයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

"(3) පළාත් සභාවක (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වන කාන්තා මන්ත්‍රීවරයකු සම්බන්ධව පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, තේරී පත් වී සිටින කාන්තා අපේක්ෂකයකු හෝ මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සකු වී සිටින කාන්තා අපේක්ෂකයකු නොවන, ඡන්ද කොට්ඨාස ලැයිස්තුවෙන් හෝ දිස්ත්‍රික් ලැයිස්තුවෙන් කාන්තා අපේක්ෂකයකු නම් කිරීමෙන් පමණක් එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන ඉවත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය, ඒ වගන්තියේ "මන්ත්‍රීවරයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

'' "වැඩි සංඛ්‍යාව" යන්නෙන්, යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින්, එම පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට, මේ පනතේ 58අ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව තෝරා පත් කිරීම සඳහා හිමිකම ලබන මන්ත්‍රීවරයන් ගණන ඉක්මවමින් පරිපාලන දිස්ත්‍රික්කයකින් පළාත් සභාවකට තේරී පත්වන අපේක්ෂකයන් සංඛ්‍යාව අදහස් වේ; ".

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.